| | | |
|---|---|---|
| දිනය | : | 2021.05.16 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | : | 12 ශ්‍රේණිය පැවරුම් |
| විෂය භාර ගුරු | : | ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර |
| **නිර්දේශිත ග්‍රන්ථය** | : | **සද්ධර්මරත්නාවලිය** |

**ප්‍රශ්නය : රසවිඳීමට අපූරු කතා පුවතක් සහ ආගමික වශයෙන් සදුපදේශ ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අභිප්‍රාය වූයේ ය. නිර්දිෂ්ට කතා පුවත් ඇසුරෙන් නිදසුන් දක්වමින් විමසන්න.**

**පිළිතුර සඳහා මග පෙන්වීම : මට්ටකුණ්ඩලී කතා පුවත**

- **නිර්දේශිත ග්‍රන්ථය (සද්ධර්මරත්නාවලිය) පිළිබඳ කෙටියෙන් හැඳින්වීම.**
- **සාමාන්‍ය පොදු ජන සමාජය අරමුණු කර ගෙන කෘතිය රචනා කිරීම :-**

**නිදසුන : ''එසේ හෙයින් නුවණ මඳ වත් කුශලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දහ පින්කම්හි හැසිර නිවන් සාදා ගනිත් නම් එසේ වූ සත් පුරුෂයනට වැඩ සඳහා සද්ධර්මරත්නාවලිය නම් වූ ප්‍රබන්ධයක් කරම්හ.''**

**තම කතා වස්තු නිර්මාණයට පාදක කරගත් පාලි ධම්මපදට්ඨ කතාවේ පාලි ක්‍රමය ඉවත් කරමින් පොදු ජන සමාජයට ගැළපෙන රසවත් බසක් නිර්මාණය කිරීම :-**

**නිදසුන : ''පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි.... ''**

- **ශ්‍රැති ගෝචර ශෛලිය පාදක කර ගැනීම :-**

**නිදසුන : ''සැවැත් නුවර අදින්නපුබ්බක නම් බමුණෙක් කෙනෙක් වෙසෙති. උෟ තුමූ සුධා භෝජන ජාතකයෙහි කෙළ ගණන් වස්තු ඇති සිටාණන් .... ''**

- **උපමා/ රූපක/ ප්‍රස්තාව පිරුළු → චරිත, අවස්ථා හා සිද්ධි නිරූපණ සඳහා යොදා ගැනීම.**

**උපමා** :- **''තණ අග ගලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට නුදුන් විරූ ය. .... ''**

**''නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ .... ''**

**''දවාලූ කඩ රෙද්දට ලෝභයෙන් හඬන්නා සේ .... ''**

**උපමාමාලා** :- **''පැතුව මනා දෙය තබා පොල් ගසින් තල් පක් පතන්නා සේ, ගින්නෙන් සිසිල පතන්නා සේ, අකුසලින් සැපත් පතන්නා සේ .... ''**

**''පුන්සඳ මඬලෙන් භාගයක් රත් වලායකිත් වසන කලක් පරිද්දෙන් ද විදුලියක් හා සමාන පටි ධතුන් වහන්සේ බැඳගෙන ...සිතුකුළු පච්ච බඳුවද මල් දමින් වෙලන කලක් මෙන් ද....''**

**රූපක** :- **''මට්ටකුණ්ඩලී නමැති කුඩමසු, පිළ නමැති දිය කෝල්බඩ හොත්තේ බුදුන්ගේ නුවණ දැලට තමා සම්භවුව මනා හෙයින් .... ''**

**ප්‍රස්තාව පිරුළු** :- **''ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ ....''**

**''පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ .... ''**

- **පොදු ජන වහරේ යෙදුම් පාදක කර ගැනීම :-**

**''ඇඹුලකින් තඹ මලකඩ නැති වන්නා සේ .... ''**

**''වී අවදියේ නො ලැබ්බ හැකි වියට හඬන්නා සේ .... ''**

**''සාද විඳ සිටියවුන්ට බුලත් දී සාදය නිමවන්නා සේ .... ''**

- කට වහරේ වදන් පාදක කර ගැනීම :-

''බමුණු මිය ගිය පුතු දවා පියා මළ පුතු අරභයා හඬමින් දවාපූ සොහොන්හි ඇවිද්දි....''

- නාට්‍යානුසාරී දෙබස් පාදක කර ගැනීම :-

''තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර....''

''පින්වත් බැමිණිය කුමක් කියයි ද?....''

''මාගේ රථ මැදිරියෙක් ඇත. ඒ තෙමේත් ගනරන්මුවා ය....''

''ලදොත් ජීවත් වන්නා මුත් නොලදොත් ජීවිතය හරමි....''

''එම්බල බමුණ, අසන දෙයටත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්‍ෂය.....''

- ධර්මෝපදේශ දානයෙන් සමාජය යහමගට ගැනීම අරමුණුකොට ගෙන රචකයා කතාව ආරම්භයේ දීත්, කතාව අතරතුර දීත්, කතාව අවසානයේ දීත් සුදුසු පරිදි අවධානය යොමුකර තිබීම.

කතාව ආරම්භයේ දී :-''යම් කෙනෙක් නුවණ නමැති පහන් ඇසින් කුශල් මගට බැස ලසු වූත් කුශලයෙහි හැසිරෙත් නම් ඒ නිසා ලබන ලොවී ලොව්තුරා සැපත් මට්ටකුණ්ඩලී වස්තුවෙන් දක්වම්හ''

කතාව අතරතුර දී :-'' මේ අවස්ථාවට පිළිවන් ව තිබෙන සිත පැහැදී ම කෙරෙමි'යසිතා ....''

කතාව අවසානයේ :-'' එසේ හෙයින් සියලුම පින්කමට ප්‍රධාන වූ සිත පහදවා පින් කරව ....''

''එසේ හෙයින් සත් පුරුෂයන් විසින් සද්ධර්මරත්නාවලී නමැති මූණු බලා ශීල- සමාද්ධ්‍යාදී ගුණ ශොභාවෙන් හොබනේ මැනවි.''

- මට්ටකුණ්ඩලී වස්තුවෙන් ප්‍රායෝගික ජීවිතයට ලබා දෙන සදුපදේශ

- සිටුවරයෙකු වූ අදින්නපුබ්බක තම එක ම පුතුට නිසි වයසේ දී පලන්දන ආභරණ ඉතා දිළින්දෙකුගේ තත්ත්වයටත් නොගැලපෙන ලෙස සාදා දුන් නිසා දරුවාට ආවේණික නමක් ද පටබැඳීම: එබැවින් දරුවා සමාජයේ උපහාසයට ලක්වීම.
- කෙතෙක් ධනය තිබුණ ද තම ප්‍රාණසාරී එක ම පුතුට නිසි පෝෂණයෙන් යුතු වූ ආහාර-පාන ලබා නො දුන් බැවින් පුතු රෝගාතුර වීම: එනම් දැඩි මසුරුබව තමන්ටත් තමන් ඇසුරු කරන්නන්ටත් අනර්ථකාරී වන බව ධර්මසේන පසක් කරලයි.

- අදින්නපුබ්බකගේ දැඩි මසුරු මානසිකත්වය නිසා දරුවාගේ රෝගයට නිසි ප්‍රතිකාර නොකිරීමෙන් එක ම දරුවාව ඔහුට අහිමි වීම.
- පියාගේ දැඩි මසුරු මානසිකත්වය නිසා දරුවාගේ රෝගයට නිසි ප්‍රතිකාර නොලැබීමෙන් දරුවාට සිය ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීම.
- බුද්ධ ශ්‍රාවකයෙකු ව කටයුතු කිරීමෙන් මහත් ඵල මහත් ආනිශංස ලැබිය හැකිබව
- අකුශලය ගැල අදින ගොනු පසුපස එන්නා වූ රියසක මෙන් තමා පසුපස එනබව.
- පහන් සිතින් කළ කුශලය තමාගේ ඡායාව හැර නොයන සෙවනැල්ල සේ තමා හා එක් ව වසනබව.